# කූට ව්‍යාපාරිකයාගෙන් ගොවියා ගලවාගත් සංවිධානය

*ආර්. එම්. සුනිල් රණබාහු*
සභාපති, ව්‍යාපාර කමිටුව, කවුඩුළුවැව

**ප්‍රශ්නය:-**
ජාතික මට්ටමින් ගොවි සංවිධානයක් පිහිටුවා ගතහොත් දැනට නොවිසඳී තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමට හැකියාවක් ලැබෙයි ද?

**පිළිතුර:-**
දිස්ත්‍රික් මට්ටමින් ගොවි සංවිධාන ගොඩ නගලා ඊට පසුව පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් සංවිධාන බිහි වුනොත් හොඳයි කියා මම හිතනවා. මෙහිදී වැදගත් වන්නේ ඒවා ගොවි සංවිධානම වීමයි. නිලධාරී අවශ්‍යතාවය උඩ බිහි වෙන සංවිධාන සාර්ථක වන්නේ නැහැ. (නිලධාරී අවශ්‍යතාවන්ට අනුව) දේශපාලන පැත්තට නොගියොත් යටත් පිරිසෙන් නිලධාරීන්ගේ පැත්තටවත් යෑමට ඉඩ තිබෙනවා.

**ප්‍රශ්නය:-**
ගොවියාගේම සංවිධානයක් ලෙස සැලකීමට නම් තිබිය යුතු ලක්ෂණ මොනවාද?

**පිළිතුර:-**
ගොවියාගේම සංවිධානයක් වීමට නම් 1. ජනපදයේ ඉඩම් හිමි නීත්‍යානුකූල ගොවියෙක් විය යුතු යි. 2. ඉඩම්වල පදිංචියක් නැත්නම් දැනට කුඹුරු වගා කරන තෙක් ඇල සංවිධානයේ සාමාජිකයෙක් විය යුතු ය. 3. ඇල පද්ධතිය පිළිබඳව "තමන්ගේ" යන හැඟීම තිබිය යුතු යි. එසේ නොමැති වුවහොත් මුදලාලි කෙනෙකුට මේක ආක්‍රමණය කරලා පුද්ගලයින් පිරිසක් ගොවියන් වශයෙන් දමා ගෙන පෞද්ගලික ලාභ ප්‍රයෝජන ගන්න ඉඩ තිබෙනවා. ප්‍රධාන පරමාර්ථය සේ ලාභ ප්‍රයෝජන ගැනීම තබා ගතහොත් ජාතික මට්ටමේ කෙසේ වෙතත් බෙදුම් ඇල මට්ටමින් වත් ක්‍රියාත්මක කිරීම අපහසු වෙනවා.

**ප්‍රශ්නය:-**

ජාතික මට්ටමේ ගොවි සංවිධානයක් ගොඩ නැගීමේ දී යම්කිසි පුද්ගලයෙකුට හෝ කාණ්ඩායමකට මේ සඳහා නායකත්වය දීමට සිද්ධ වෙනවා. මෙවැනි නායකත්වයක් වර්ධනය වෙලා තියෙනවා ද?

**පිළිතුර :-**
දැනට ව්‍යාපාර මට්ටමේ ගොවි සංවිධාන ගොඩ නැගිලා තිබෙන ජනපදවල ගොවි නියෝජිතයින් සමග සාකච්ඡා කරලා තියෙනවා. අනතුරුව දිස්ත්‍රික් ගොවි සංවිධාන පිහිටුවා ඒවායේ නියෝජිතයන් සමග සමස්ථ ලංකා ගොවි සංවිධානයක් පිළිබඳව තොරතුරු ලබාගැනීමට අදහස් කර තිබෙනවා.

**ප්‍රශ්නය:-**
දැනට දිස්ත්‍රික් මට්ටමින් යම්කිසි සංවිධානයක් තියෙනවා ද?

**පිළිතුර:-**
දැනට මහා වාරිමාර්ග යටතේ ගොවි සංවිධාන ගොඩ නැගිලා තියෙනවා.දිස්ත්‍රික් ගොවි සංවිධාන කොහේවත් තවම නැහැ. ව්‍යාපාර ගොවි සංවිධාන පමණයි තියෙන්නේ. අම්පාර, පොළොන්නරුව, මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල හා අනෙකුත් මහා වාරිමාර්ග සමග සාකච්ඡා පත්වලා තියෙනවා. තව මාස දෙකකින් විතර අනික් අයත් සමග එකතුවෙලා ගතයුතු පියවර ගැන කථා කිරීමට අපේක්ෂා කරනවා. ගොවි සංවිධාන කොතැනක කවුරුන් පිහිටුවා ගත්තත් එක අරමුණක් තිබිය යුතු යි. ගොවි සංවිධාන වලින් අරමුණක් නැති වැඩ කරන්න ගියොත් ගොවියාට අනාගතයක් නැති වෙනවා. ගොවි සංවිධාන වල බලය ගොවියා තුළ රඳවා ගත යුතු යි. ඒ නිසා ගොවියන් වශයෙන් එකතු වෙලා තීරණය කළ යුතුයි "කළයුතු දේ කුමක් ද" කියා.

අනික් අතට බලන විට කෘෂිකර්ම අමාත්‍යංශයේ අනුග්‍රහය ලබා ගෙන පිහිටුවා ගනු ලබන ගොවි සංවිධාන තිබෙනවා. ඉඩම් අමාත්‍යංශයේ ජල කළමනාකරණ අංශය යටතේ පිහිටුවනු ලබන ගොවි සංවිධාන තිබෙනවා. ගොවීන් වශයෙන් මේකත් අපට ලොකු ගැටලුවක්. ගොවි සංවිධාන වලට ලැබෙන සැළකිල්ල අඩු වැඩි වීමට මේකත් එක හේතුවක් වි තිබෙනවා.

**ප්‍රශ්නය:-**
ජාතික මට්ටමේ සංවිධානයක් ගොඩ නැගීමෙන් පසුව ගොවීන්ට පොදුවේ අත් වේ යැයි සිතන ප්‍රතිලාභ මොනවා ද?

**පිළිතුර:-**

මුල්ම ප්‍රතිලාභය තමයි භාණ්ඩ වලට හොඳ ඉල්ලුමක් පවත්වා ගෙන යෑම. යෙදවුම් සාධාරණමිලකට, සාධාරණ ක්‍රමයකට, කලට වේලාවට ලබා ගැනීම, තරඟකාරී වෙළඳ පොලකට ගැලපෙන පරිදි වාණිජ භෝග වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ගොවියාගේ ආර්ථික සමාජික හා සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට යෝග්‍ය ව්‍යාපෘති දියත් කිරීම. අතරමැදියෙකුගෙන් තොරව රජයත් සමග අදල වාණිජ ආයතන සමග සාකච්ඡා කොට මිළ තීරණය කිරීම, ක්‍රමවත් වගා පද්ධතියක් හඳුන්වා දීමට ද අවස්ථාව තිබේ. උදහරණයක් වශයෙන් ගතහොත් එක් එක් කලාපවල වගා කළ හැකි යෝග්‍ය භෝග පිලිබඳව පැහැදිලි අවබෝධයක් ගොවියාට තිබෙනවා නම් අනවශ්‍ය ලෙස වගා කොට අතිරික්තයක් වෙළඳ පොළට පැමිණීම ද වලක්වා ගත හැක. මේ තුළින් වෙළඳපොල ස්ථවරත්වයක් රඳවා ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත.

ජාතික මට්ටමින් සංවිධානය වී සිටියහොත් අවශ්‍ය තැනකදී රජයත් සමග වුවද සාකච්ඡා කර යම් යම් ඉල්ලීම් දිනා ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කරනවා. ඒ වගේම ගොවියාට එන අභියෝගයන්ට මුහුණ දීමට ද ශක්තිය ලැබෙන බවට කිසිදු සැකයක් නැහැ.

**ප්‍රශ්නය:-**

ජාතික මට්ටමේ සංවිධානයක් බිහිකිරීමට දරන ප්‍රයත්නය දීර්ඝ ගමනක ආරම්භයක් පමණි. එම ගමන ඇරඹීමට දැනට පවතින වෙළඳ ඒකාධිකාරය අභියෝගයක් නොවයි ද? එම අභියෝගයට මුහුණ දෙන්නේ කෙසේ දැයි සිතුවා ද?

**පිළිතුර:-**
මැදිරිගිරිය, කවුඩුලුවැව ව්‍යාපාරය දෙස බලන විට මෑතක් වනතුරු ව්‍යාපාරිකයින් ඉතාමත් ප්‍රබල මට්ටමකයි සිටියේ. හේතුව, පොහොර, මිළ, කෘෂි රසායන ද්‍රව්‍ය, බිත්තර වී ආදී සියල්ලක්ම ගොවියා මිළදී ගත්තේ. වෙළෙන්දගේ ග්‍රහණය තුළ ජීවත් වෙමින්

ගොවියා හුදෙක් මුදලාලිට කප්පම් ගෙනැවිත් දෙන ප්‍රාණ ඇපකාරයෙක් බවට පත් වී සිටියා. නමුත් මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී තිබෙනවා. උදහරණයක් වශයෙන් ගතහොත් ගොවි සංවිධාන අලෙවියට අවතීර්ණ වීම නිසා ලැබුණුවායි කිපයක් සඳහන් කළ හැක. වෙළෙන්ද රු. 600/= විකුණන වික්සුපර් තෙල් බෝතලයක් ගොවි සංවිධානය මගින් රු. 510/= වැනි මුදලකට ලබා දුන්නා. රු. 550/= විකුණන පොහොර මිටිය (කී.ග්‍රෑ. 50) ගොවි සංවිධානයේ අලෙවි සැලෙන් රු. 495/= කට ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. මේ මිළට සංවිධානයේ විකුණන්නේ සුළු කොමිස් මුදලකුත් ඇතුවයි. (5%) මෙවැනි වැඩ පිළිවෙලක් රට පුරාම වුවත් ක්‍රියාත්මක වුවහොත් අද මුදලාලිලා විඳින සැප හෙට ගොවියාට විඳීමට අවස්ථාවක් සැලසෙනවාට කිසිදු සැකයක් නොමැත.

**ප්‍රශ්නය :-**

පළාත් සභා මන්ත්‍රීවරයෙක් එසේත් නැතහොත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට අසුනක් දිනාගතහොත් ගොවීන් වෙනුවෙන් මේ හා සමාන සේවයක් කරන්න පුළුවන් කමක් නැද්ද?

**පිළිතුර :-**

මම හිතනවා එවැනි තනතුරකට පත් වෙන්න සිදු වෙයි කියා. හේතුව ජාතික මට්ටමේ ගොවි සංවිධාන පවත්වා ගෙන යනවා නම් ගොවීන් පිළිබඳව, කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳව හඬක් නැංවීමට වේදිකාවක් තිබිය යුතුයි. ගොවි සංවිධාන වලින් ගොඩ නැගුණු නායකත්වයක් පාර්ලිමේන්තුවට, පළාත් සභාවට ඇතුළු වුවහොත් ගොවි අයිතීන් දිනා ගැනීමට යමක්කළ හැකි වෙතැයි සිතනවා.

**ප්‍රශ්නය:-**

පක්ෂයක් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට/ පළාත් සභාවකට මන්ත්‍රීවරයෙක් වශයෙන් ගියහොත් පක්ෂ ප්‍රතිපත්ති අනුගමනය කරමින් ගොවීන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට කොතරම් දුරට ඉඩක් ලැබෙයි ද?

**පිළිතුර:-**

මන්ත්‍රීවරයෙක් වශයෙන් යනවා නම් මෙහි දී පක්ෂයක් නියෝජනය කරලා යන්න හම්බ වෙන්නේ නැහැ. ස්වාධීන පුද්ගලයෙක් හැටියට පාර්ලිමේන්තුවට ඇතුල් වෙන්න වෙනවා. රජයට කෙලින්ම තර්ජනයක් වන අන්දමේ සංවිධාන පිහිටුවීමත් දීර්ඝ කාලීන වශයෙන් ගොවියාට හානිකර වෙන්න ඉඩ තිබෙනවා. හේතුව රජය එවැනි සංවිධාන බිහිවීම සුහදයී ලෙස නොදකින නිසයි.

**ප්‍රශ්නය:-**

රණබාහු මහත්මයා වැනි අදහස් දරණ එවැනි නායකත්වයකට සකස් වෙච්ච ගොවි මහත්වරු කවුඩුලුවැව ව්‍යාපාරයේ තවත් ඉන්නවා ද? නැත්නම් වෙනත් ව්‍යාපාරවල ඉන්නවා ද?

**පිළිතුර:-**

කවුඩුලුවැව ව්‍යාපාරයේ බෙදුම් ඇල සංවිධාන 22 ක් තියෙනවා. ඉන් 18 කම ඉතාමත් හොඳ නායකත්වයක් තියෙනවා. කෙත් ඇල නියෝජිතයෝ මේ ආකාරයට පුහුණු වෙච්ච නියෝජිතයෝ. මෙවැනි හොඳ ගොවි නියෝජිතයෝ බිහි වූයේ හිටපු ව්‍යාපාර අධිකාරී කුරුප්පු මහතාගේ මඟ පෙන්වීම නිසයි. ඒ මහත්මයා තමන්ගේ රාජකාරිය හරියාකාරව ඉෂ්ඨ කර තිබෙනවා. මම විශ්වාස කරනවා අතීත් පැතිවලත් එවැනිම හොඳ නායකයෝ බිහිවෙලා ඇති කියා.

**ප්‍රශ්නය:-**

ගොවි සංවිධාන නියෝජිතයෙකු හැටියට පත් වී ව්‍යාපාර කමිටුවේ සභාපති දක්වා ඉහළට යාමට අවස්ථාවක් සැලසුනේ කොහොමද?

**පිළිතුර:-**

මම මුලින්ම ඇතුල් වුනේ සාමාන්‍ය ගොවියෙකු හැටියටයි. මම උපාධිය දක්වා ඉගෙන ගෙන තිබෙනවා (කොළඹ විශ්ව විද්‍යාලය) විශ්ව විද්‍යාල අධ්‍යාපනය හමාර කොට ඇවිත් දිගටම ගොවිතැන් කටයුතු වල නියැලුනා. ගොවි සංවිධාන සංකල්පය හඳුන්වා දුන් අදියරේ සිට (1984) මම කුරුප්පු මහත්මයා සමඟ සමීපව කටයුතු කළා. ඒ මහතා ගේ මඟ පෙන්වීම යටතේ මට නොයෙකුත් තරාතිරම්වල නිලධාරීන් සමග සාකච්ඡා කිරීමට, ප්‍රශ්න ඉදිරිපත් කිරීමට අවස්ථාවක් උදා වුනා, තායිලන්ත සංචාරයෙනුත් වැදගත් දේවල් රාශියක් ඉගෙන ගත්තා. ව්‍යාපෘති අධ්‍යක්ෂතුමාගෙනුත් ලොකු අනුග්‍රහයක් ලැබුණා. ඒ මගින් ගොවි සංවිධානයක් කියන්නේ කුමක් ද? ගොවි සංවිධානයකින් කළ හැකිවැඩ මොනවා ද යන්න ආදී දෑ ඉගෙන ගත්තා එසේම ගොවි සංවිධායක මහත්වරු, මහත්මියන්/ මෙනෙවියනුත් විශාල කැප වීමකින් තමන්ගේ පුහුණුව ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාරය තුළ සේවය කළ නිසා අපට නිතැතින්ම ඒ අඩිපාරේ ගමන් කිරීමට සිදු වුනා. අපි අතීත් සිදු වෙච්ච වැරදි දෙස විවෘතව බලා ඒවා සකස් කිරීමට දරණ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් අද සෑම බෙදුම් ඇලකම සිටින සභාපතිවරයෙකු ව්‍යාපාර කමිටුවේ සභාපති ධුරය දරන්න පුළුවන් මට්ටමකට පුහුණුවත්, අත් දැකීමත් ලැබී තිබෙනවා.

**ප්‍රශ්නය:-**

ගොඩ නගා තිබෙන ගොවි සංවිධාන මොන විධියේ දිසාවකද ගමන් කරවීමට බලාපොරොත්තු වෙන්නෙ. මේ සංවිධාන වල අවසාන ඉලක්කය කුමක් ද?

**පිළිතුර:-**

දුෂ්කරතා මැද්දේ ඉතාමත් වෙහෙස මහන්සියකින් ගොඩනැගී මෙම සංවිධාන ප්‍රයෛජනයට ගෙන ඇල පද්ධතිය මනාව ආරක්ෂා කර ගැනීමයි මූලික පරමාර්ථය. එවිට ගොවියාගේ සමාජ, ආර්ථික හා දේශපාලන අංශ සියල්ලක්ම සතුටුදයක මට්ටමක වර්ධනය වෙනු ඇත. ඉන් පසු මුළු ව්‍යාපාරයේ ම මෙහෙයුම් හා නඩත්තු කටයුතු භාරගෙන කරගෙන යෑමයි අපේ අවසාන ඉලක්කය. මීට අමතරව අපි බලාපොරොත්තු වෙන්වා බෙදුම් ඇල මට්ටමින් ගොවීන්ට අවශ්‍ය යෙදවුම් සියල්ල සංවිධානය මාර්ගයෙන් බෙද හැරීමට.

**ප්‍රශ්නය:-**

මෙම වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා රාජ්‍යමය පැත්තෙන් ලැබෙන සහයෝගය පිළිබඳව මහත්මයාගේ අදහස කුමක් ද?

**පිළිතුර:-**

කවුඩුලු වැව ව්‍යාපාරයේ ගොවි සංවිධාන වැඩපිළිවෙලට අනුග්‍රහය දැක්වූයේ වාරිමාර්ග පද්ධති කළමනාකරණ ව්‍යාපෘතිය මගිනි. මුල දී අප තුළ පැවති අඩු දැනුවත්කම නිසා ගතයුතුව තිබූ ප්‍රයෝජන රාශියක් මගහැරී ගියා, ධර්මදස බණ්ඩා ඇමති තුමාගේ වැඩ පිළිවෙල දෙස බලන විට අප ගොඩ නැගු සංවිධාන වලට හොඳ අනාගතයක් උදා වෙතැයි බලාපොරොත්තු තියන්න පුළුවන්. නමුත් මෙහි දී එක් දෙයක් සිහි කැඳවිය යුතු යි. එනම් සංවිධාන කිසියම් පිළිගත් රටාවකට අනුව සකස් විය යුතු යි. අතික් අතට සංවිධාන අඛන්ඩව පවත්වාගෙන යාමට නම් රජයේ නිලධාරියෙකු ව්‍යාපෘතියේ රැඳී සිටිය යුතු යි. එහෙම නොවුනොත් ගොවියාගේ ගතිකත්වය නොකඩවා පවත්වාගෙන යෑම තරමක් අපහසු වෙනවා. මොහු කාර්ය පහසු කරවන්නෙක් සේ පමණක් කටයුතු කිරීම සෑහේ. දැනට ව්‍යාපෘතිය තුළ සංවිධානයෙන් පඩි ලබන ගොවි සංවිධායක වරු තුන්දෙනෙක් සිටිනවා. මෙය දිගටම කරගෙන යාමට නම් ප්‍රමාණවත් තරම් ක්‍රියාකාරකම් තිබිය යුතු යි. ක්‍රියාකාරකම් තීරණය වන්නේ සංවිධාන සතුව පවතින අරමුදල් අනුවයි. එය එතරම් සතුටුදයක නැහැ. මේ නිසා අපි අපේක්ෂා කරනවා ලක්ෂ 7 ක 8 ක ණය මුදලක් රජයෙන් ලැබෙනවා නම් ඒවා ප්‍රයෝජනයට ගෙන ගොවි සංවිධානයට යෝග්‍ය ආකාරයට ආයෝජනය කළ හැකි වෙයි කියා.

දැනට කරගෙන යන පුහුනු පංති ප්‍රමාණවත් නැහැ. ඒවායේ කාලයත් අන්තර්ගතයත් ගොවීන්ගේ/ නියෝජිතයන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සකස් විය යුතු යි. උදා:- වශයෙන් මූල්‍ය කරණය සහ කෘෂිකර්මය සම්බන්ධයෙන් ලබා දුන් පුහුණු සඳහන් කල හැක. දවස් පහක පමණ නේවාසික පුහුණුවක් ලබා දුන්නා නම් මීට වඩා ප්‍රයෝජනයක් වෙන්න තිබුනා.

**ප්‍රශ්නය:-**

මූල්‍යකරණයේ, පොත් තබාගැනීමේ අඩුපාඩුකම් දැනට තිබෙනවා ද?

**පිළිතුර:-**

මේවා දැනට කරගෙන යන්නේ සාමාන්‍ය තත්ත්වයෙන්. ගොවි සංවිධාන මහත්වරු දැනට ඒවායේ පරීක්ෂා කිරීම් කරගෙන යනවා. ව්‍යාපාර ගොවි සංවිධානයේ ගිණුම් ලිපිකරු මහතා සෑම සංවිධානයකම ගිණුම් පරීක්ෂා කරනවා. නමුත් මෙය ඉදිරියේදී කරන්න අමාරු වෙනවා. හේතුව ගොවි සංවිධානයක මහත්වරුන්, මහත්මියන් ඉවත් කිරීමට යනවා. ගිණුම් ලිපිකරු මහතාට සියල්ලක් තනිවම කරගෙන යාම අපහසු යි. බෙදුම්ඇල සංවිධානවල මූල්‍ය කටයුතු නොවැටී පවත්වාගෙන යාමට නම් ඒවායේ සිටින භාණ්ඩාගාරික මහත්වරුන්ට, මහත්මියන්ට හොඳ පුහුණුවක් ලබාදීම මෙහි දී වැදගත් වෙනවා.

**ප්‍රශ්නය:-**

දැනට තිබෙන අරමුදල් නයට දී ඒ මාර්ගයෙන් මුදල් තත්ත්වය වර්ධනය කර ගැනීමට සිතුවේ නැද්ද?

**පිළිතුර:-**

ඔව්. අපි දැනට එවැනි වැඩ පිළිවෙලක් කරගෙන යනවා. සංවිධානය සතුව රු. ලක්ෂ 20 ක් පමණ තිබෙනවා. මේවා ප්‍රයෝජනයට ගෙන පොහොර ලොරි 20 ක් පමණයි ගන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් මේ ප්‍රමාණය ඉල්ලුමට කෙසේවත් සරිලන්නේ නැහැ. මේ නිසා ගොවීන් නැවතත් පෞද්ගලික ව්‍යාපාරයන්ගේ ග්‍රහණයට අකමැත්තෙන් වුව ද හසුවීමට සිදු වෙනවා. මේ තත්ත්වයෙන් ගොඩ ඒමට තිබෙන එකම විසඳුම නම් විශාල මුදලක් වැය කොට ප්‍රමාණවත් තරම් පොහොර බෙදා හැරීමයි. එමගින් සංවිධානයේ සාමාජික ගොවීන්ට විශාල සහනයක් ලැබෙන අතර, සංවිධානයටත් ආදායමක් ලබා ගන්න පුළුවන් වෙනවා.

**ප්‍රශ්නය**

ගොවි සංවිධාන ව්‍යාපාර අංශයට (අලෙවියට) නැඹුරු වීම ගැන දරණ අදහස කුමක් ද?

**පිළිතුර**

සංවිධාන වාණිජ පැත්තට නැඹුරු වන්නේ නැහැ. අපි දැනට පොහොර, වී කෘෂි රසායන අලෙවි කළත්, වී මිල දී ගන්නත් ඒවා කරන්නේ සේවාවක් වශයෙනුයි. පරමාර්ථය ලාභ ලබා ගැනීමට නොවේ. ගොවියාගෙන් වෙළෙන්දන්ට යන මුදල් අවම කිරීමයි, අපේ උත්සාහය. හුදෙක් ව්‍යාපාර අංශයට නැඹුරු වුනොත් සමුපකාර සමිති වලට අත් වූ ඉරණම අපටත් අත් වෙන්න පුළුවන්. ගොවීන්ට සේවාවක් කරමින් සුළු මුදලක් පොදු යහපතට ලබා ගැනීම කිසියේත් හානිකාරක නොවන බව මාගේ පිළිගැනීමයි.

**ප්‍රශ්නය:-**

ව්‍යාපාර සංවිධානයෙන් පඩි ලබන සේවකයකු පත් කිරීමෙන් රජයෙන් අධීක්ෂණ කටයුතු සඳහා පුද්ගලයෙකු යොදවන එකත් වෙනසක් තිබෙනවා ද?

**පිළිතුර:-**

ඔව් තිබෙනවා, සංවිධානයෙන් පඩි ලැබෙනවා නම් අවශ්‍ය වැඩ ටික කරවා ගන්න පුළුවන්. සංවිධානයට මේ ටික කරන්න පුළුවන් නම් හොඳයි. නමුත් දැනට එම බර දරන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා සංවිධානයට මුදල් අතින් ශක්තිමත් වනතුරු රජයෙන් හෝ කෙනෙක් සිටීම ඉතාමත් වැදගත්. නැත්නම් මේ ඇතිකර ගත්ත දියුණුව අභිමව යන්න පුළුවන්. රජයේ අධීක්ෂක හුදෙක් මා මුලින් සඳහන් කළ පරිදි කාර්ය පහසු කර වන්නෙක් පමණක් විය යුතු යි. ඔහුට ගොවි සංවිධානය පාලනය කරන්න තමාගේ අභිමතාර්ථය අනුව මෙහෙය වන්න ඉඩ දීමක් බලාපොරොත්තු වෙන්නේ නැහැ.

දැනට කවුඩුලු වැවේ ව්‍යාපාර අධිකාරී වරයෙක් නැහැ. ආයතන සංවර්ධන නිලධාරී මහතා අපි සමග ඉතාමත් සහයෝගයෙන් කටයුතු කරනවා. ඔහු තමාගේ වගකීම් ගොවි සංවිධාන වල නියෝජිතයින්ට භාරදී කරගෙන යාමට අවශ්‍ය වාතාවරණය ගොඩ නගනවා. අපි සැබවින් ම අපේක්ෂා කරන නායකත්වය මග පෙන්වීම එයයි. ආයතනික සංවර්ධන නිලධාරී මහතා හොඳ නායකයකුගේ ලක්ෂණ පෙන්නුම් කරමින් කටයුතු කරන අතර අපටත් එම තත්ත්වයට පත්වීමට අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රශ්නය:-**

දැනට ගොවි සංවිධාන භාරව වාහන, කෘෂි උපකරණ තිබෙනවා ද?

**පිළිතුර:-**

ඔව්. අප ව්‍යාපාර ගොවි සංවිධානයට ට්‍රැක්ටර් (පොඩි) හතරක් ධර්මදාස බණ්ඩා ඇමති තුමාගේ උපදෙස් මත ලැබී තිබෙනවා. ඒ ගැන අපි ඉතාමත් කෘතඥ වෙනවා. නමුත් මෙවැනි ට්‍රැක්ටර් හතරකින් ව්‍යාපාරයේ තිබෙන ප්‍රශ්න (සී සෑම, කොල පෑගීම, ප්‍රවාහනය) විසඳන්න බැහැ. යටත් පිරිසෙයින් බෙදුම් ඇල සංවිධානයකට එක බැගින්වත් (ලොකු ට්‍රැක්ටර්) ලබා දුනහොත් එය අපේ සංවිධාන වලට විශාල අතදීමක් වෙනවා. ඉදිරි වසර තුළ දී සංවිධානයට ලොරියක් ගැනීමට සැලැස්මක් තිබනවා. ඒ මගින් දැන් කෙරෙන ප්‍රවාහන වියදම් ඉතිරි කර ගෙන සංවිධානයට වත්කමක් ලබා ගැනීමට හැකියාව තිබෙනවා. මේ සම්බන්ධයෙන් දැනටමත් බැංකුවත් සමග සාකච්ඡා කරගෙන අවසානයි.

**ප්‍රශ්නය:-**

ගොවි සංවිධානයට බලපාන වැදගත් මෙතෙක් විසඳී නැති යමක් තිබෙනවා ද?

**පිළිතුර**

ඔව්. තිබෙනවා. ප්‍රවාහන පහසුකමක් නැති කම විශාල පාඩුවක්, දැනට මේ යල (1993) කන්නය සඳහා රු. 35,000 කට අධික මුදලක් ඩීසල් වෙනුවෙන් (ගමන් බිමන් වෙනුවෙන්) වැය කරලා තිබෙනවා. ඊට අමතරව මම දිනපතාම පැට්‍රෝල් වෙනුවෙන් මාගේ පෞද්ගලික මුදල් වලින් යටත් පිරිසෙයින් රු. 50 ක්වත් වැය කරනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා ව්‍යාපාර කමිටුවේ සභාපතිවරුනට දීමනාවක් නොදී මාසයක ඉන්ධන වෙනුවෙන් මුදලක් වෙන් කරන මෙන්. ඊට අමතරව දුරකථනයක් ඉතාමත් වැදගත්. ඇතැම් අවස්ථා වල දී අපිට දිසා ලේකම් තුමාගෙන්, මහ ඇමති තුමාගෙන්, වාරිමාර්ග නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමාගෙන් පණිවිඩ එනවා. මේවාට පිළිතුරු දෙන්න පෞද්ගලිකව යන්න සිදු වෙනවා. ඒක අමතර වියදමක්. ඇතැම් විට එක පුද්ගලයෙකුගේ අවශ්‍යතාවයට දෙන්නෙක් යන්නත් සිදු වෙනවා. මෙය වලක්වා ගැනීමට හොඳම පිළියම හැටියට මම දන්නේ දුරකථනයයි. එමගින් මුදලුත් කාලයත් දෙකම ඉතිරි කර ගන්න පුළුවන්.

අනික් අඩුපාඩුව තමයි ප්‍රමාණවත් පොහොර නොමැති කම, සංස්ථාවෙන් පසුගිය කන්නයේ දී අවශ්‍ය තරම් පොහොර ලැබුනේ නැහැ. කොළඹට ලොරි ගෙන ගොස් හිස් අතින් ඇවිත් ලොරි අටකට (8) රු. 20,000 ක මුදලක් නිරපරාදයේ වැය කරන්න සිද්ධවුනා. මෙහි අඩුපාඩුකම් වලට රජය වගකිය යුතු අංශ වල අවධානය යොමු වෙතැයි අපේක්ෂා කරමි. එසේ වුවහොත් කැප වීමෙන් කරගෙන යන මේ සේවාව ඉදිරියටත් කරගෙන යන බව ගොවි දිනය වෙනුවෙන් සමස්ථ ගොවි ජනතාවටම ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි.